www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නාසින් යටතේ ද අද ද වද හිංසනයට ලක්වන රෝමාවරු

## The persecution of Roma—under the Nazis and today

2010 සැප්තැම්බර් 18

රෝමාවරු තොග පිටින් පිටුවහල් කිරීමේ වගකීම ප්‍රන්ස ආන්ඩුව මත දැමීමට යුරෝපීය සංගමයේ කොමසාරිස් විවියන් රෙඩින් දැරූ උත්සාහය පැය කිහිපයකට පසුව නතර විය. යුරෝපීය කොමිසමේ ප්‍රධානී ජෝසේ මැනුවෙල් බරෝසෝ හා තවත් යුරෝපීය ආන්ඩු ප්‍රධානීන් ගනනාවක් රෙඩින්ගේ වචන හරඹය විවේචනයට ලක් කිරීමෙන් අනතුරුව, නාසීන් විසින් සිදු කරන ලද පිටුවහල් කිරීම් සමග මෙය සමාන කිරීම වෙනුවෙන් ඇය සමාව ඇයැද සිටියාය. ප්‍රන්ස ජනාධිපති නිකොලායි සාකෝසි, රෙඩින් විසින් නගන ලද චෝදනා කෝපයෙන් යුතුව ප්‍රතික්ෂේප කල අතර තම ආන්ඩුව පිටුවහල් කිරීමේ ප්‍රතිපත්තිය වෙනස් නොකරනු ඇති බව තරයේ කියා සිටියේය. සාකෝසිගේ ස්ථාවරය ඉතාලියනු ආන්ඩු ප්‍රධානී සිල්වියෝ බර්ලුස්කෝනිගේ සහයෝගය ක්ෂනිකවම දිනා ගත්තේය.

16 දින පැවැත්වුනු යුරෝපීය සංගමයේ නායක සමුවේදී, සාකෝසි බරෝසෝ වෙත කෝපයෙන් කඩා පැන්න අතර එය, බොහෝ නිරීක්ෂකයන් දැක ගත්තේ වඩා ප්‍රබල සාමාජික රටවල් විසින් කොමිසමේ තත්වය තවදුරටත් හීන කරන අවස්ථාවක් ලෙස ය. දැන් යුරෝපීය ආන්ඩු සහ රාජ්‍ය ප්‍රධානීන් විසි හත් දෙනා ඔවුන්ගේ ඊලග හමුවේදී "ප්‍රශ්නය විසඳීම සඳහා දිගුකාලීන මූලෝපායක්" සාකච්ඡා කිරීමට එකග වී ඇත.

කම්කරුවන් මේ දක්වා භුක්ති විඳින එක් සීමිත නිදහසක් වන යුරෝපීය සංගමයට අයත් ඕනෑම රටක ජීවත් වීමට සහ වැඩ කිරීමට ඇති අයිතිය අහෝසි කිරීමේ හුදු ආරම්භක ලක්ෂ්‍යය බවට රෝමාවරු මුල්කරගත් මතභේදය පත්විය හැකි බවට කනස්සල්ලක් ඇතිව තිබේ. වර්තමාන ගැටුම පිපිරී ඒමට ඉහතදී පවා යුරෝපීය සංගමයේ කොමිසමේ සභාපති බරෝසෝ, එල් පාඉස් නම් ස්පාඤ්ඤ පුවත්පතට සැප්තැම්බර් 09 වනදා ප්‍රකාශ කර තිබුනේ "හැසිරීම සඳහා වන නිදහස පරම අයිතියක් ලෙස ගැනීම වරදක් වනු ඇති" බවයි.

රෙඩින් වැනි පාලක පන්තියේ තනි පුද්ගල නියෝජිතයන් විසින් මතු කරන ලද සැක සාංකා තිබියදී පවා ජාතිකවාදය හා ඒ සමග බැඳුනු ආගන්තුකයන් නොරිස්සීම හා වර්ගවාදය යුරෝපය පුරා හිස ඔසවනු දැකිය හැක. මෙම ක්‍රියාවලියේදී, මානව හා පුරවැසි අයිතීන් පසෙකට තල්ලුවෙමින් පවතී. මෙසේ වන්නේ කුමක් නිසා ද?

රෝමාවරුන්ට එරෙහිව සාකෝසිගේ ප්‍රහාර ජනප්‍රිය වී නැත. ඔහුගේ ඉතාලි සගයා වන බර්ලුස්කෝනිගේ මෙන් ඔහුගේ ද ඡන්දදායකයින් අතර ජනප්‍රියත්වය සෑම විටම පහල මට්ටමක පවතී. මිලියන හැට පහක් වන ප්‍රන්ස වාසීන්ගෙන් 15,000 ක තුනී සුලුතරයක් පමනක් වන විදේශ ගමන් බලපත්‍ර සහිත රෝමාවරුන්ට එරෙහි සාකෝසිගේ ව්‍යාපාරය, මුස්ලිම්වරුන්ට එරෙහි ඔහුගේ කෙනහිලිකම් ද සමග ගත් කල නියෝජනය කෙරෙන්නේ, උග්‍ර වෙමින් ඇති සමාජ ආතතීන් වර්ගවාදී මාවත් වෙත යොමු කිරීමේ අධම උත්සාහයකි.

මෙතෙක් දුරට සාකෝසි අසාර්ථක වී ඇත. රෝමාවරු පිටුවහල් කිරීමට එරෙහිව උද්ඝෝෂනය කිරීමට දහස් ගනනක් වීදි වලට බැස ඇත. මෙයට දින කිහිපයකට කලින්, මිලියන තුනක් ජනතාව සාකෝසිගේ විශ්‍රාම වැටුප් කප්පාදු වැඩසටහනට එරෙහිව විරෝධතාවයේ යෙදුනහ.

එසේ වුවත්, වාර්ගික හා මුස්ලිම් විරෝධී මනෝභාවයන් ඇවිලවීමට දරන උත්සාහය දැඩි වෙමින් තිබේ. මෙසේ සිදුවන්නේ ප්‍රන්සයේ පමනක් නොවේ. ඕලන්දයේ, ඩෙන්මාර්කයේ, ඔස්ට්‍රියාවේ, ඉතාලියේ, හන්ගේරියාවේ හා අනෙකුත් රටවල වර්ගවාදී පක්ෂ, මඩි තර කර ගත් මූල්‍ය සමපේක්ෂකයන්ගේ සහයෝගයට පින් සිදු වන්නට, සැලකිය යුතු බලපෑමක් කිරීමට සමත්ව සිටී. ජර්මනියේදී තිලෝ සැරසින් විසින් මෑතකදී ප්‍රකාශයට පත් කරන ලද, බොහෝ මාධ්‍ය තුලින් ප්‍රචාරය ලැබුනු පොතක්, මුස්ලිම්වරුන්ට එරෙහිව වාර්ගික අගතීන් ඇවිස්සවීමට භාවිතා කරන ලදී.

අවසානයේදී ජාතිකවාදයේ හා වර්ගවාදී දහ ජරාවේ මෙම රැල්ල, ඒ හෝ මේ ප්‍රතිගාමී දේශපාලඥයකුගේ පෞද්ගලික ප්‍රවනතාවයකට ලඝු

කල නොහැක. මෙම ප්‍රවනතාවය එයට වඩා පුලුල්ව පැතිරී ඇත. අතීත දුෂ්ඨත්වයෙන් වැඩී එන පනුවන් මෙන් මෙය ධනවාදී සමාජයේ පරිහානියේ සහ කුනුවීමේ ප්‍රතිඵලයයි.

සමාජ අසමානතාවය වැඩී යාම, එනම්, වරප්‍රසාද සහ ධනය සුලුතරයක් විසින් ගොඩ ගසා ගනු ලැබීම සහ ඉමහත් බහුතරයකගේ විරැකියාව සහ දුප්පත්කම විශාල ලෙස ඉහල යාම, ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව අයිතිවාසිකම් සමග එකට පැහෙන්නේ නැත. පාලක පන්තිය, ආගන්තුකයන් නොරිස්සීම හා වර්ගවාදය වැලඳ ගනු ලබන්නේ, තමන් සිහි බුද්ධියෙන් සිටින අවස්ථාවල මෙය තමන්ව ව්‍යසනය කරා යොමු කරන බව දැන දැනත් බෝතලය කරා ඇදී යන සුරා සොඬෙකු මෙනි.

දෙවන ලෝක යුද්ධය ආරම්භයේදී, ලියොන් ට්‍රොට්ස්කි, ජරපත් වන ධනවාදයේ ද මාරක ප්‍රතිඵල ගෙන දෙනු ඇතැයි ඔහු අපේක්ෂා කල යුදෙව් විරෝධයේ නැගීම ද අතර සම්බන්ධය ප්‍රබල ලෙස පෙන්වා දෙනු ලැබුවේ මෙසේය. "දිරාපත්වන ධනේශ්වර ලෝකය තදබද වී ඇත....විදේශ වෙලඳාම ක්ෂය වී යාම හා දේශිය වෙලඳාමේ පිරිහීම සමග අත්වැල් බැඳගෙන ස්වෝත්තමවාදය හා විශේෂයෙන්ම යුදෙව් විරෝධය මහා පරිමානයෙන් උත්සන්න කෙරෙන අවධියක් එලඹෙයි. තම නැගී ඒමේ කාල වකවානුවේදී, ධනවාදය, යුදෙව්වන් ඔවුන්ගේ වාසස්ථාන වලින් පිටතට ගෙන, තම වෙලඳමේ ප්‍රසාරනය සඳහා මෙවලමක් ලෙස යොදා ගත්තේය. අද දවසේ දිරාපත් වන ධනවාදී සමාජය උත්සාහ ගනිමින් සිටින්නේ යුදෙව්වන් තමන්ගේ සියලුම සිදුරු තුලින් මිරිකා හැරීමටයි. බිලියන දෙකක් වන ලෝක ජනගහනයෙන් සියයට එකකටත් වඩා අඩු මිලියන 17 ක මිනිසුන්ට, තව දුරටත් අපගේ ග්‍රහලෝකයේ වාසස්ථානයක් සොයා ගැනීමට නොහැක. මහ පොලොව මෙන්ම උඩු ගුවන ද මිනිසා සඳහා ජයගෙන, භූමියේ දැවැන්ත ප්‍රසාරනයක් ද තාක්ෂනික විශ්මයන් ද අත්කරගෙන ඇති තත්වයේදී ධනේශ්වරය, අපගේ ග්‍රහ ලෝකය ජුගුප්සාජනක සිර ගෙයක් බවට පරිවර්තනය කොට ඇත.

අද දින, මුස්ලිම්වරුන් දඩයම් කිරීම යුදෙව් විරෝධයේ ස්ථානය ගෙන ඇත. (එනමුත් හන්ගේරියාව වැනි සමහර රටවල යුදෙව් විරෝධය ද න්‍යාය පත්‍රයට ඇතුලත් වේ.) ආර්ථික වර්ධනයේ කාලය තුලදී මුස්ලිම් කම්කරුවන්, තුර්කිය සහ මැග්‍රෙබ් සිට ශ්‍රමිකයන් ලෙස යුරෝපයට ගෙන එනු ලැබීය. වර්තමානයේදී ඔවුන්, සිය රැකියා අහිමි වීමේ සහ සමාජයෙන් පිටමන් කිරීමටත් අවසානයේ පිටුවහල් කිරීමටත් ගොදුරු වන පලමු වැන්නන් බවට පත් වී ඇත.

කෙසේ වතුදු, රෝමාවරුන් වධ හිංසාවට පත් කිරීම දිගටම එක ලෙස පැවතී ඇත. යුදෙව්වන්ගෙන් පසුව, නාසීන්ගේ ජන සංහාරය සඳහා ඉලක්ක කර ගනු ලැබූ වඩාත්ම ලාබ ජන කන්ඩායම වූයේ ඔවුන්ය. නාසීන්, ඔවුන් පහත් වර්ගයකට අයත් යැයි වර්ගීකරනය කර, බලයෙන් ජීවානුහරනය කර, "අභිකුන්ටික කඳවුරු" වල සිරගත කර, බලහත්කාරයෙන් ශ්‍රමිකයන් ලෙස භාවිතා කරනු ලැබූ අතර ක්‍රමිකව මරනයට පත් කලහ.

දෙවන ලෝක යුද්ධයට පෙර මිලියනයක් පමන සින්ටි සහ රෝමා ජනතාවක් යුරෝපයේ වාසය කලහ. ඔවුන්ගෙන් කොතරම් දෙනෙක් ඝාතනය කරන ලද්දේ ද යන්න නිශ්චිතවම තහවුරු කිරීම කෙදිනකවත් සිදු කර නොමැත. මධ්‍යස්ථ ගනන් බැලීම්වලට අනුව ඔවුන්ගෙන් හතරෙන් පංගුවක් නාසීන් සහ ඔවුන්ගේ මිත්‍ර පාක්ෂිකයන් විසින් මරනයට පත් කරන ලදී. අනෙකුත් ඇස්තමේන්තු පෙන්වා දෙන්නේ ගොදුරු වූවන්ගේ සංඛ්‍යාව 500,000 ක් බව යි.

සාකෝසි සහ ඔහුගේ ආන්ඩුව නැවත වරක් රෝමාවරු තමන්ගේ වාර්ගික ව්‍යාපාරයේ ඉලක්කය කරගෙන තිබීමේ කාරනය, එදා සිට අද දක්වා තත්වය වෙනස් වී ඇත්තේ කෙතරම් සුලුවෙන්ද යන්න පෙන්නුම් කරයි. වාර්ගික විෂ පැතිරවීමෙන් ඔවුන් වැලැක්වීමට, විසි වන ශතවර්ෂයේ වඩාත්ම බිහිසුනු අපරාධය පවා ප්‍රමානවත් වී නොමැත.

යුරෝපීය සංගමයේ කොමසාරිස් රෙඩින් ප්‍රන්ස ප්‍රතිපත්තිය නම් කලේ "අවමානයක්" වශයෙනි. මෙය දැන් සිදු වෙමින් පවත්නා තත්වය අඩු ලංසුවට දැමීමකි. එසේ වුවත්, යුරෝපීය ආන්ඩු වල පීඩනය හමුවේ ඇයට සමාව ගැනීමට බල කෙරුනි. මෙයින් පෙන්නුම් කරන්නේ යුරෝපීය ප්‍රභුව කිසිවක් ඉගෙන ගෙන නොමැති බවයි. එක් අවධියකදී විප්ලවවාදී ප්‍රන්සයේ විශිෂ්ටත්වයේ සංකේතයක්ව පැවති සිවිල් හා මානව අයිතිවාසිකම් වෙනුවෙන් එහි ප්‍රභු පැලැන්තිය තුල දැන් කිසිදු සැලකිය යුතු සහයෝගයක් නොමැත.

යුරෝපය නැවත වතාවක්, ට්‍රොට්ස්කි විස්තර කරන ලද, "ජුගුප්සාජනක සිර ගෙයක්" බවට පත් වෙමින් තිබෙන්නේ ඒ හා බැඳුනු සියලුම සන්ත්‍රාසයන් ද සමග ය. මෙම මාරක වර්ධනයන්ට නැවතීමේ තිත තැබිය හැකි වන්නේ සමාජවාදී යුරෝපයක් සඳහා වන කම්කරු පන්තියේ සටනක් මගින් පමනකි.

පීටර් ශ්වාට්ස්

© www.wsws.org